ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 මාර්තු 03 යොමු අංකය 1718-037

දයාබර දෙමව්පියන් වෙත,

**තුන් සූත්‍රය කට පාඩම් දීමේ තරඟය** මාර්තු මස 17 වැනිදා සිකුරාදා දහම් පාසල් කාල සීමාව තුල සිදු කෙරෙන බව කරුණාවෙන් දැනුම් දෙමු.

කලින් අයදුම් පත්‍ර භාර දුන් දරුවන් හට සූත්‍ර කට පාඩම් දීමට ඉදිරිපත් විය හැක.

තුන් සූත්‍රය කටපාඩම් දීමේ පළමු, දෙවන සහ තෙවන අදියරයන් ඉතා සාර්ථක ලෙස පසුගිය වසර තුන තුළ පවත්වන්නට යෙදුනි. මෙම වසරේ සිට සූත්‍ර තුනම එක තරඟයක කොටස් ලෙසට **2017 මාර්තු මස 17 වැනිදා** පැවැත්වීමට කටයුතු යොදා ඇත. එක සූත්‍රයක් හෝ එහි කොටසක් වයස් ඛාණ්ඩ අනුව සජ්ජායනය කිරීමෙන් මෙම තරගයට සහභාගී විය හැක. තරගයේ ව්‍යුහය සඳහා අයදුම්පත කියවන්න.

පසුගිය තරඟ වලට සහභාගී වී සම්පූර්ණ සූත්‍ර කටපාඩම් දී කුසලාන ලබා ගත් දරුවන්ට ද මෙම තරඟයට සහභාගී විය හැකි නමුත් කුසලාන නැවත නොදෙන බවත් සහභාගී වීම සඳහා සහතික පත්‍රයක් ලබා දෙන බවත් කරුණාවෙන් සලකන්න.

මෙම තරඟයට උපකාරී වන ශ්‍රවනයට සහ කියවීමට නිර්දේශිත මූලද්‍රව්‍ය දහම්පාසල් වෙබ් අඩවියෙන් http://www.dhahampasala.org/ ලබාගත හැක. ඔබ සැම දරුවන් සමඟ මෙම සූත්‍රයන්ට සවන්දීම, නිවසේදී සජ්ජායනා කිරීම දිනපතා සිදුකරනු ඇතැයි අපගේ බලාපොරොත්තුවයි.

ඔබගේ දරුවා මෙම තරඟයට ඉදිරිපත් වේ නම් කරුණාකර අදාළ සූත්‍ර හොඳින් කටපාඩම් කරවා සූදානම් කරවන්න.

ස්තූතියි,
සංවිධායක කමිටුව

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org